# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,288 — 1961 පෙබරවාරි 13 වැනි සඳුද — 13.2.1961**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

අ. ආ. කා. අංකය: සී. 244/60.

**1961 අංක 57**

අධිකරණ ඇමති, සෙනෙට් සභික ගරු ඇස්. පී. සී. ප්‍රනාන්දු මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 49 වැනි වගන්තිය යටතේ, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, සෞඛ්‍ය ඇමති, සෙනෙට් සභික ගරු ඒ. පී. ජයසූරිය මහතා තම රාජකාරිවලට අතිරේකව, 1961 පෙබරවාරි 12 වැනි දින සිට, අධිකරණ ඇමති වශයෙන් වැඩ බැලීමට පත් කළ බව, මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1961 පෙබරවාරි 12 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේදී.

2-606

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### අංක 1/61 දරන අපනයන පාලන දැන්වීම

**ගෙඩි පොල් අපනයනය**

ගෙඩි පොල් අපනයනය සඳහා, 1961 අප්‍රියෙල් 30 වැනිද දක්වා නැවට පැටවීමට වලංගු වන බලපත්‍ර පාලක තැනගේ මනාපය පරිදි දැන් නිකුත් කරනු ලබන බව අපනයනකරුවන් වෙත මෙයින් දනුම් දෙනු ලැබේ. බලපත්‍ර සඳහා අයැදුම් පත් '' ක්‍යු '' ආකෘති පත් 3 කින් හා '' ක්‍යු ඒ '' ආකෘති පත් 2 කින් යුක්ත කොට මෙම කාර්‍යාලයට ඉදිරිපත් කළ යුත්තේ ස්ථිර කෙරුණු ඇණවුම් ඔප්පු කෙරෙන ලියකියවිලි සාක්ෂ්‍යයන්ද සමග ය.

ඊ. එස්. ද සිල්වා,
ආනයන හා අපනයන පාලක වෙනුවට.

1961 පෙබරවාරි 10 වැනිද,
කොළඹ දීය.

2-569

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

107—ජේ ඇන්. ආර් 15569—4,150 (2/61)